THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

GMOA

ESTABLISHED IN 1926

TU No. 291

No 275/75, Professional Centre Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/01/09

## මාධ්‍ය නිවේදනයයි

### ශ්‍රී ලංකාවේ වින්නඹු මාතා සේවය විනාශ කිරීමට ගත් උත්සාහය හා එහි ප්‍රතිඵල

වින්නඹු මාතා සේවය ලංකා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍ය සේවාවට පසුව බිහි වූ පැරණිතම සේවාවකි.

මව්වරුන්ගේ පූර්ව ප්‍රසව, ප්‍රසව සහ පසු ප්‍රසව සංරක්ෂණය වින්නඹු සේවාවේ අරමුණයි. ලංකාවේ වින්නඹු සේවාව ලෝකයේ අනිකුත් රටවල වින්නඹු සේවාවන් අභිබවා ගුණාත්මකභාවයෙන් ඉහල සේවාවක් අඩු වියදමකින් ලබා දෙන බව ප්‍රචලිතය. එය පසුගිය සියවස පුරාවටම ශ්‍රී ලංකාවේ මාතෘ මරණ හා ළදරු මරණ අනුපාත සංවර්ධිත රටවල මට්ටමට ගෙන ඒමට දායක වීමෙන් ශ්‍රී ලංකා වින්නඹු සේවය තම සාර්ථකත්වය පෙන්වා ඇත.

මෙම වින්නඹු සේවය අනෙකුත් සේවාවන් මෙන්ම වෙනම තාක්ෂණික සේවාවක් වන අතර එය තවදුරටත් වෙනම ක්ෂේත්‍රයක් ලෙස දියුණු කිරීම කල යුතුව ඇත.

නමුත් ඒ වෙනුවට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිලිබඳ කිසිදු දැනුමක් නැති අය නායකත්වය දරන වෘත්තිය සමිති සිය අවශ්‍යතා මත හෙදියන්ට වින්නඹු පුහුණුව ලබා දීමට මෑත කාලයේ දැඩි උත්සාහයක් ගනිමින් සිටී. මෙය ලංකාවේ නිදහස් සෞඛ්‍ය සේවාව විනාශ කිරීමට ගත් පියවරකි. මෙමගින් වින්නඹු සේවය විනාශයට යාමත්, ඒ නිසා ලංකාවේ මාතෘ හා ළදරු සුරක්ෂිතභාවය පිලිබඳ ගැටළු ඇතිවීමත් නොවැලැක්විය හැකි බව අප තරයේ අවධාරණය කරමු. තවද දැනටමත් මේ පසුබිම තුල සූතිකාගාරවල හෙදියන් හා වින්නඹු මාතාවන් අතර ගැටළු පැන නැගීමෙන් සෞඛ්‍ය සේවා බිඳ වැටෙමින් ඇත.

විවිධාකාර සේවාවල නියැලෙන හෙදියන්ට වඩා වින්නඹු කර්මයේම නියැලෙන වින්නඹු මාතාවන්ගේ දරු ප්‍රසූතිය පිලිබඳ දැනුම ඉහල බව එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන ප්‍රසව හා නාරි විශේෂඥ වෛද්‍යවරුන් අපට පෙන්වා දී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ලෙස, හෙදියන්ට දෙන වින්නඹු පුහුණුව නවත්වා දැනට රට පුරා පවතින හෙද නිභය පියවීමට පුහුණුව නිම කල හෙදියන් වහාම මුදා හරින ලෙස ඉල්ලා සිටී.

වෘත්තිය සමිති ඉල්ලීම් මත පදනම් වූ අත්තනෝමතික තීරණ මගින් ලංකාවේ සෞඛ්‍ය සේවාවට සිදුවන මහත් අගතිය අදාල පාර්ශවයන් භාරගත යුතුය. හෙද, හෙදියන්ට වින්නඹු පුහුණුව ලබාදීමෙන් සූතිකාගාර ආශ්‍රිතව ඇති වන සංකූලතා වල වගකීම තවදුරටත් වෛද්‍යවරු නොදරන බවත් ඇතිවන නීතිමය ගැටළු වලදී වෛද්‍යවරුන් කිසිදු ආවරණයක් ලබා නොදෙන බවත් තරයේ අවධාරණය කර සිටිමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා :

| | | |
|---|---|---|
| වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |
| වෛද්‍ය සාරද කන්නන්ගර | - | 0773810794 |